# මාධ්‍ය නිවේදනය
## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
## සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය - 2026
## ප්‍රවේශපත්‍ර බාගත කිරීම හා ප්‍රවේශපත්‍ර සංශෝධනය කර ගැනීම.

2026 සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය 2026.10.24 වන දින විභාග මධ්‍යස්ථාන 1520 කදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. මෙම විභාගය සඳහා වන ප්‍රවේශපත්‍ර අදාළ පාසල්වල විදුහල්පතිවරුන් / පෞද්ගලික පාසල් ප්‍රධානීන් වෙත 2026.10.15 වන දින තැපැල් මගින් යොමු කරනු ඇත. සියළුම ප්‍රවේශපත්‍ර 2026.10.16 දින සිට බාගත කර ගැනීම සඳහා පහසුකම් සලසා ඇත.

<u>රජයේ පාසල් :-</u> ප්‍රවේශපත්‍ර සංශෝධනය කර ගැනීම සඳහා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වෙත පිවිස විදුහල්පතිවරුන් වෙත ලබාදී ඇති පරිශීලක නාමය සහ මුරපදය (School code හා Password) උපයෝගි කරගෙන අදාළ ප්‍රවේශපත්‍ර සංශෝධනය කරගත යුතු වේ.

<u>පෞද්ගලික පාසල් :-</u> ප්‍රවේශපත්‍ර සංශෝධනය කර ගැනීම සඳහා විභාග දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය වෙත පිවිස Private School මත Click කර පාසල් ප්‍රධානීන් වෙත ලබාදී ඇති පරිශීලක නාමය සහ මුරපදය (School code හා Password) උපයෝගි කරගෙන අදාළ ප්‍රවේශපත්‍ර සංශෝධනය කරගත යුතු වේ.

අපේක්ෂකයින්ගේ නම, මාධ්‍ය සංශෝධන තිබේ නම් එම වෙබ් අඩවිය තුළින් සිදු කල හැකි අතර, සංශෝධන සිදු කිරීම 2026.10.19 දින මධ්‍යම රාත්‍රියෙන් අවසන් කෙරේ. කිසිදු හේතුවක් මත සංශෝධන දිනය නැවත දීර්ඝ කරනු නොලැබේ.

මෙම විභාගය සම්බන්ධයෙන් කිසියම් විමසීමක් තිබේ නම්, ඒ සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පහත සඳහන් සන්නිවේදන මාධ්‍ය ඔස්සේ විමසීම් කළ හැකි බව කාරුණිකව දන්වමි.

| | |
|---|---|
| ක්ෂණික ඇමතුම් අංකය | : 1911 |
| දුරකථන අංක | : 0112784208, 0112784537 |
| ෆැක්ස් අංකය | : 0112784422 |
| විද්‍යුත් තැපැල | : gcealexam@gmail.com |

ඒ.කේ.එස්. ඉන්දිකා කුමාරි ලියනගේ
විභාග කොමසාරිස් ජනරාල්

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල
2026 ඔක්තෝබර් 14 දින